# පාස්කු දින ප්‍රහාරයෙන් අඩපණ වූ ව්‍යාපාර සමීක්ෂණයකට

(හසිත රංග ගුණතිලක)

පාස්කු ඉරු දින ප්‍රහාරය හේතුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සිදුවූ ආර්ථික හානිය තක්සේරු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් සමීක්ෂණයක් පැවැත්වීමට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ.

ඒ අනුව 2018 වසරේ ජනවාරි මාසයේ සිට මැයි 31 දක්වා කාලය තුළ සහ 2019 වසරේ ජනවාරි සිට මැයි 31 දක්වා කාලය තුළ එක් එක් මාසයේ සේවය කළ සේවක සංඛ්‍යාව සහ දළ ආදායම මෙහිදී සොයා බැලෙන අතර පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් හානි සිදුවූ ආයතන, වාහන, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර ආදිය පිළිබඳ තොරතුරු රැස් කරන බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසු ආර්ථික අපහසුතාවයට පත් වූ වෙළඳ හා සේවා ආයතන (සේවක සංඛ්‍යාව 10ට අඩු), මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය, පුපුරණ ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත, ධීවර කටයුතු ආදිය පිළිබඳව ද මෙහිදී සමීක්ෂණය කරන බව ද එම දෙපාර්තමේන්තුව කියයි..